රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils & Local Government**

ස්වදේශ කටයුතු අංශය
உள்நாட்டலுவல்கள் பிரிவு
**Home Affairs Division**

"නිල මැදුර", ඇල්විටිගල මාවත, කොළඹ 05.
"நில மெதுர", எல்விடிகல மாவத்தை, கொழும்பு 05
"Nila Madura", Elvitigala Mawatha, Colombo 05.

TP : +94 112 050 450
Fax : +94 112 369 971
Email: info@moha.gov.lk
Web : www.moha.gov.lk

මගේ අංකය / எனது இல / My No } HA/3/7/28-5

ඔබේ අංකය / உமது இல / Your No }

දිනය / திகதி / Date } 2024.04.07

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිසාපතිවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්.

<u>පරිපාලන ග්‍රාම නිලධාරී හා ග්‍රාම නිලධාරී වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම - 2025</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2022.12.14 දිනැති අංක 2310/29 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කාර්ය පටිපාටික රීති 1 වැනි කාණ්ඩයේ XVIII වැනි පරිච්ඡේදයේ විධි විධාන සහ ග්‍රාම නිලධාරී හා පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරුවීම් ප්‍රතිපත්තිය අනුව 2025 වර්ෂය සඳහා පරිපාලන ග්‍රාම නිලධාරී හා ග්‍රාම නිලධාරී වාර්ෂික ස්ථාන මාරු වීම් ක්‍රියාත්මක කරනු ලැබේ.

02. 2024.12.31 දිනට එක් ග්‍රාම නිලධාරී වසමක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති ග්‍රාම නිලධාරීන් සහ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වසර 05 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති පරිපාලන ග්‍රාම නිලධාරීන් අනිවාර්යෙන්ම ස්ථාන මාරු කළ යුතුය. ග්‍රාම නිලධාරීන් ස්ථාන මාරු කිරීමේදී ඔවුන් වැඩ බලන වසමට ස්ථාන මාරු නොකිරීමට හැකි සෑම විටම වග බලා ගත යුතු අතර, ලබා දෙන ස්ථාන මාරු නියෝග අමාත්‍යාංශය වෙත (ඇමුණුම 01) ප්‍රකාරව ඉදිරිපත් කළ යුතුය.

03. 2024 වාර්ෂික ස්ථාන මාරු නියෝග, සංගණනයේ ලැයිස්තුගත කිරීමේ රාජකාරී හා මැතිවරණ නාම ලේඛන ප්‍රතිශෝධන රාජකාරී කටයුතු සිදු කිරීම හේතුවෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි 2024.03.01 දක්වා තාවකාලිකව අත්හිටවූ බැවින් මෙම වර්ෂයට පමණක් ස්ථාන මාරු ප්‍රතිපත්තියේ සඳහන් කාලසටහන පහත පරිදි සංශෝධනය වේ.

| | |
|---|---|
| අප්‍රේල් මස 20 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර කැඳවීම පිළිබඳව දැන්වීම නිකුත් කිරීම |
| අප්‍රේල් මස 30 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුව පිහිටුවීම |
| මැයි මස 31 දිනට පෙර | අදාළ බලධාරියා වෙත වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම්පත්‍ර භාර දීම |
| ජූනි මස 15 දිනට පෙර | අදාළ බලධාරියා වෙත ලැබෙන වාර්ෂික ස්ථාන මාරු අයදුම්පත්‍ර අදාළ වාර්ෂික ස්ථාන මාරු කමිටුවට භාර දීම |
| ජූනි මස 30 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ ස්ථාන මාරු යෝජනා අදාළ බලධාරියා වෙත ලිඛිතව භාර දීම |
| ජූලි මස 15 දිනට පෙර | යෝජිත වාර්ෂික ස්ථාන මාරු පිළිබඳ දැන්වීම් නිකුත් කිරීම |

| | |
|---|---|
| ජූලි මස 31 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු සමාලෝචන කමිටු පත් කිරීම |
| අගෝස්තු මස 15 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටුව විසින් යෝජිත වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් වන තම ලිඛිත නිර්දේශ දිස්ත්‍රික් ලේකම් වෙත භාර දීම හා පුරප්පාඩු ලේඛනය සහ ස්ථාන මාරු නියෝග (ඇමුණුම 01 පරිදි) අමාත්‍යාංශය වෙත යොමු කිරීම. |
| ඔක්තෝම්බර් මස 01 දිනට පෙර | වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම |
| ජනවාරි මස 01 දින සිට | වාර්ෂික ස්ථාන මාරු නියෝග බලාත්මක වේ. |

**04.** ඒ අනුව 2025.01.01 දින සිට ග්‍රාම නිලධාරී ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වසම් අතර ස්ථාන මාරු සඳහා ප්‍රාදේශීය ලේකම් විසින්ද, දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරුවීම් සඳහා දිස්ත්‍රික් ලේකම් විසින් ද ඉල්ලුම්පත් කැඳවීමටත් එම ස්ථාන මාරු සලකා බැලීම සඳහා ස්ථාන මාරු මණ්ඩල අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමෙන් පත් කිරීමටත් මෙම මණ්ඩලවල නිර්දේශ අනුව ස්ථාන මාරුව ලබා දීමටත් කටයුතු කළ යුතුය.

**05.** තවද, ප්‍රාදේශීය ලේකම් විසින් සිදු කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් පිළිබඳ සෑහීමට පත් නොවන අයෙකුට ඒ පිළිබඳ අභියාචනා දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලය වෙතත්, දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කරනු ලබන වාර්ෂික ස්ථාන මාරු නියෝගයන් පිළිබඳව සෑහීමකට පත් නොවන අයෙකුට ඒ පිළිබඳ අභියාචනා මෙම අමාත්‍යාංශයේ අභියාචනා මණ්ඩලයටත් තම ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව ස්ථාන මාරු කිරීමේ නියෝගය නිකුත් කල දින සිට දින 14 ක් ඇතුළත (ඇමුණුම 02) පරිදි ඉදිරිපත් කළ යුතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කළ යුතුය. අදාළ දිනට පසු ලැබෙන අභියාචනා හා නියමිත ක්‍රමවේදයෙන් බැහැරව සිදු කරනු ලබන අභියාචනා හා ඉල්ලීම් පිළිබඳව කිසිදු සළකා බැලීමක් කරනු නොලැබේ.

**06.** අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කරන ග්‍රාම නිලධාරීන් තම අයදුම්පත් මීට අමුණා ඇති (ඇමුණුම 03) ප්‍රකාරව සකස් කර ප්‍රාදේශීය ලේකම් සහ දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සහිතව මෙම අමාත්‍යාංශය වෙත 2024.06.30 දිනට පෙර යොමු කළ යුතු වේ. නියමිත ආකෘතියෙන් හා ක්‍රමවේදයෙන් බැහැරව යොමු කරනු ලබන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**07.** 2025 වර්ෂයේ දිස්ත්‍රික් අතර වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා නියමිත දිනට පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳ සළකා නොබලන අතර විනය හේතු මත හෝ රාජකාරී අවශ්‍යතා මත හෝ විශේෂ හේතුවක් මත සිදු කරනු ලබන ස්ථාන මාරු පමණක් ක්‍රියාත්මක කෙරේ.

**08.** පරිපාලන ග්‍රාම නිලධාරී ස්ථාන මාරු (ග්‍රාම නිලධාරී අධි ශ්‍රේණිය) දිස්ත්‍රික් අතර හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අතර ස්ථාන මාරු ලබා ගැනීමට අපේක්ෂා කරන නිලධාරීන් තම ඉල්ලුම් පත්‍රය (ඇමුණුම 01) නියමිත දිනට පෙර ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් මඟින් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක වසර 05ට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් ස්ථාන මාරු ඉල්ලුම් කර නොමැති වුවද ස්ථාන මාරු ප්‍රතිපත්තියේ විධිවිධාන අනුව වෙනත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට ස්ථාන මාරු කිරීමට යටත් වනු ඇත.

2025 වර්ෂයේදී දිස්ත්‍රික්කය තුළ සිටින නිලධාරීන් ස්ථාන මාරු කළ යුතු ආකාරය පිළිබඳ නිරීක්ෂණ හෝ නිර්දේශ ඇත්නම් එම නිර්දේශ හා යෝජනා සමඟ මෙම ඉල්ලුම්පත් නියමිත දිනට පෙර අමාත්‍යාංශය වෙත එවීමට සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළ යුතු වේ.

09. තවද, 2024.12.31 දිනට එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක වසර 05ක සේවා කාලය සම්පූර්ණ වන පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ වාර්තාවක් මෙහි (ඇමුණුම 04) පරිදි 2024.06.01 දිනට පෙර අමාත්‍යාංශය වෙත එවීමට සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් කටයුතු කළ යුතුය.

10. මෙම අයදුම්පත් කැඳවීම පිළිබඳ සියළුම ග්‍රාම නිලධාරීන් හා පරිපාලන ග්‍රාම නිලධාරීන් දැනුවත් කරන ලෙසත් දිස්ත්‍රික්ක තුළ හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ස්ථාන මාරු ප්‍රතිපත්තිය යටතේ 2024 වර්ෂයට සිදු කරන සියළුම ස්ථාන මාරු 2025.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි ඊට අදාළ කටයුතු අවසන් කිරීමට පියවර ගත යුතුය. මීට අමතරව වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තියේ සඳහන් විධි විධාන සැළකිල්ලට ගනිමින් කටයුතු කළ යුතු බව දන්වා සිටිමි.

11. තවද, නවක ග්‍රාම නිලධාරීන් බඳවා ගැනීමේ කටයුතු මේ වන විට ක්‍රියාත්මක වන බැවින් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවතින පුරප්පාඩු එම නව බඳවා ගැනීමේදී සම්පූර්ණ කිරීමට නියමිත බැවින්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල අතර ග්‍රාම නිලධාරීන් ස්ථාන මාරු කිරීම් බඳවා ගැනීමේ කටයුතු අවසන් කරන තෙක් තාවකාලිකව අත්හිටුවන මෙන් ද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එච්.එම්.නන්දසේන
අතිරේක ලේකම්
(ස්වදේශ කටයුතු)

අත්/කළේ:- ප්‍රදීප් යසරත්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

ඇමුණුම 01

# ග්‍රාම නිලධාරී වාර්ෂික ස්ථාන මාරු - 2024

දිස්ත්‍රික්කය:-

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය:-

| අනු අංකය | ග්‍රාම නිලධාරීගේ නම | වර්තමාන ග්‍රාම නිලධාරී වසම | වර්තමාන ග්‍රාම නිලධාරී වසමට අනුයුක්ත කළ දිනය | 2024.12.31 දිනට වර්තමාන ග්‍රාම නිලධාරී වසම තුළ සේවා කාළය | 2025 වාර්ෂික ස්ථාන මාරු නියෝගය | ස්ථාන මාරු නියෝග නිකුත් නොකලේ නම් එයට හේතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |

**2024.12.31 දිනට අවු.05ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති සියළුම පරිපාලන ග්‍රාම නිලධාරීන්ගේ විස්තර**

දිස්ත්‍රික්කය:-

| අනු අංකය | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | නිලධාරියාගේ නාම | ජාතික හැඳුනුම්පත් අංකය | උපන්දිනය | | | වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය | | | දුරකතන අංකය | දැනට පදංචි ලිපිනය | පූර්ව සේවා ස්ථානය | වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කර තිබේද? | අයදුම් කර නොමැති නම් ස්ථාන මාරුවක් ලැබුණහොත් සේවය කිරීමට කැමති ස්ථාන 03ක් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | අවු. | මාසය | දිනය | අවු. | මාසය | දිනය | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

# වාර්ෂික ස්ථාන මාරු තීරණ සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත අභියාචනා ඉදිරිපත් කිරීම

අ. පෞද්ගලික තොරතුරු

| | | | | |
|---|---|---|---|---|
| 1 | මුලකුරු සමඟ නම -: | | | |
| 2 | තනතුර හා පන්තිය -: | | | |
| 3 | උපන් දිනය -: | අවු- | මාසය - | දිනය - |
| 4 | වයස (20.. 12.31 දිනට) -: | අවු- | මාස - | දිනය - |
| 5 | ජාතික හැඳුනුම්පත් අංකය -: | | | |
| 6 | ස්ත්‍රී/පුරුෂ භාවය -: | | | |
| 7 | ස්ථිර ලිපිනය -: | | | |
| 8 | දැනට පදිංචි ලිපිනය -: | | | |
| 9 | දුරකථන අංකය -: | | | |
| 10 | විවාහක /අවිවාහක බව -: | | | |
| | 1. කලත්‍රයාගේ නම - | | | |
| | 2. කලත්‍රයාගේ රැකියාව හා සේවා ස්ථානය- | | | |
| | 3. දරුවන් ගණන - | | | |
| | 4. ඔවුන්ගේ වයස - | | | |

ආ. සේවා තොරතුරු

| | | |
|---|---|---|
| 11 | තනතුරට පත් වූ දිනය -: | |
| 12 | වර්තමාන සේවා ස්ථානය -: | |
| 13 | වර්තමාන සේවා ස්ථානයට වාර්තා කළ දිනය -: | |
| 14 | වර්තමාන සේවා ස්ථානයේ සේවා කාලය (20....12.31 දිනට) -: | |

15 පූර්ව සේවා විස්තරය -:

| පූර්ව සේවා ස්ථානය | සේවා කාලය | |
|---|---|---|
| | සිට (අවු. මාස දින ) | දක්වා (අවු. මාස දින ) |
| 1 | | |
| 2 | | |
| 3 | | |

ඇ. වාර්ෂික ස්ථාන මාරු ඉල්ලීම පිළිබඳ තොරතුරු

| 16 | වාර්ෂික ස්ථාන මාරු අයදුම් කර ඇත/නැත | ස්ථාන මාරු අයදුම් කර ඇත්නම් අයදුම් කර ඇති සේවා ස්ථාන |
|---|---|---|
| | | 1 |
| | | 2 |
| | | 3 |

17 වාර්ෂික ස්ථාන මාරු ලැබී තිබේ නම් එම සේවා ස්ථානය -:

(දිස්ත්‍රික්කය,ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය,ග්‍රාම නිලධාරී වසම යන සියලුම විස්තර සඳහන් කරන්න)

18 අභියාචනා කමිටුව වෙත කරන ලද ඉල්ලීම පිළිබඳ තොරතුරු -:

| | අදාල කොටුවේ (√) ලකුණ යොදන්න | | එසේ ඉල්ලීම් කිරීමට හේතුව සහ ඉල්ලුම් කරන ලද සේවා ස්ථානය |
|---|---|---|---|
| * | ස්ථාන මාරුව අවලංගු කිරීම | | |
| * | ස්ථාන මාරුව සංශෝධනය කිරීම | | |
| * | නව ස්ථාන මාරුවක් ලබා ගැනීම | | |

19 දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලයේ තීරණය -:

20 දිස්ත්‍රික් අභියාචනා මණ්ඩලයට එරෙහිව අමාත්‍යාංශ අභියාචනා මණ්ඩලය වෙත අභියාචනය ඉදිරිපත් කිරීමට හේතුව -:

21 අමාත්‍යාංශ අභියාචනා මණ්ඩලයෙන් අපේක්ෂිත සහනය -:

ඉහත දක්වා ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි.

............................

දිනය -: අත්සන

22 ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය -:

දිස්ත්‍රික් ලේකම්,

........................................

නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කර නොමැති අයකු බවත් ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක/ අසතුටුදායක බවත් සුදුසු අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව/ පසුව එවීමේ පදනම මත ස්ථාන මාරුව සඳහා නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි/ නොකරමි.

........................................ ........................................

දිනය ප්‍රාදේශීය ලේකම්

23 දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය -:

ලේකම්,

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිලධාරියා විසින් ඉදිරිපත් කර ඇති ඉහත සඳහන් තොරතුරු සත්‍ය බවත් නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කර නොමැති අයකු බවත් ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක/ අසතුටුදායක බවත් සුදුසු අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව/ පසුව එවීමේ පදනම මත ස්ථාන මාරුව සඳහා නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. වාර්ෂික ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන අභියාචනය නිර්දේශ කරමි/ නොකරමි.

........................................ ........................................

දිනය දිස්ත්‍රික් ලේකම්

ඇමුණුම 03

සිය කැමැත්තෙන් දිස්ත්‍රික්කයෙන් පිටතට ස්ථාන මාරුවීම් අපේක්ෂා කරන නිලධාරීන් පමණක් මෙම ආකෘතිය සම්පූර්ණ කළ යුතුය.

පරිපාලන ග්‍රාම නිලධාරී/ග්‍රාම නිලධාරී සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම් (අන්තර් දිස්ත්‍රික්) ලබා ගැනීම සඳහා ඉල්ලුම් පත

| | | | |
|---|---|---|---|
| තනතුර හා ශ්‍රේණිය | | යොමු අංකය<br>(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) | |

| | |
|---|---|
| 01. I. නිලධාරියාගේ සම්පූර්ණ නම :- | |
| II. ජාතික හැඳුනුම්පත් අංකය :- | |
| III. නිලධාරියාගේ ස්ථිර ලිපිනය :-<br>(පෞද්ගලික ලිපිනය) | |
| • එම ස්ථානය අයත්<br>i. දිස්ත්‍රික්කය :-<br>ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :- | |
| IV. නිලධාරියා දැනට පදිංචි ලිපිනය :-<br>V. දුරකථන අංකය :- | |
| 02. දැනට සේවය කරන<br>I. දිස්ත්‍රික්කය :-<br>II. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :-<br>III. ග්‍රාම නිලධාරී වසම :- | |

| | | |
|---|---|---|
| 03. I. උපන් දිනය:-<br>අවු............මාස.............දින............ | II. වයස:- (20.....12.31 දිනට)<br>අවු.........මාස...........දින........ | III. ස්ත්‍රී/පුරුෂ භාවය:- |

| | |
|---|---|
| 04. I. ග්‍රාම නිලධාරී තනතුරට පත් වූ දිනය :-<br>II. භාෂා මාධ්‍ය :-<br>III. පරිපාලන ග්‍රාම නිලධාරී තනතුරට පත් වූ දිනය:-<br>IV. එම ශ්‍රේණියට ඇතුලත් වූ දිනය :- | |

05. I. නිලධාරියා/නිලධාරිනිය විවාහකද?
අවිවාහකද? යන වග :-
II. දරුවන් ගණන සහ ඔවුන්ගේ වයස :-
III. කලත්‍රයාගේ තනතුර හා සේවා ස්ථානය :-
IV. තනතුර :-

06. 'අ'. අවසාන වසර 05 තුළ සේවා විස්තර

| සිට (අවු./මාස/ දින) | දක්වා (අවු./මාස/දින) | මුළු කාලය (අවු./මාස/ දින) | දිස්ත්‍රික්කය | ප්‍රා/ලේ කොට්ඨාශය | ග්‍රාම නිලධාරී වසම |
|---|---|---|---|---|---|
| | | | | | |

'ආ'. නිලධාරියා මාරු වීමට අවශ්‍ය දිස්ත්‍රික්කය හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය (කැමැත්ත අනුව පිළිවෙලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03ක් සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.)

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |

07. ඉල්ලුම් කිරීමට හේතු

I.

II.

III.

08. සඳහන් කිරීමට වෙනත් හේතු ඇත්නම් :-

09. ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් ප්‍රකාශ කරමි. මා විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

.................................
දිනය

.................................
නිලධාරියාගේ අත්සන

10. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

දිස්ත්‍රික් ලේකම්

......................................

නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියා පටිපාටියක් ආරම්භ කර නොමැති අයකු බවත් ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක/ අසතුටුදායක බවත් සුදුසු අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව/ පසුව එවීමේ පදනම මත ස්ථාන මාරුව සඳහා නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරනු ලැබේ/ නොලැබේ.

......................................

දිනය

......................................

ප්‍රාදේශීය ලේකම්

11. දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශය

ලේකම්,
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

නිලධාරියාට විරුද්ධව විනය ක්‍රියාවලියක් ආරම්භ කර නැත/ ආරම්භ කර ඇති විනය ක්‍රියාමාර්ගය සඳහා ස්ථාන මාරුව ලබා දීම බාධාවක් නොවේ/ බාධාවක් වේ.

ඒ අනුව සුදුසු අනුප්‍රාප්තිකයකු සහිතව/ රහිතව/ පසුව එවීමේ පදනම මත ස්ථාන මාරුව සඳහා නිලධාරියා මුදා හැරිය හැකිය/ නොහැකිය. ඉල්ලුම් පත්‍රය නිර්දේශ කරනු ලැබේ./ නොලැබේ.

......................................

දිනය

......................................

දිස්ත්‍රික් ලේකම්